........................................

தொலைபேசி இல. / Telephone Nos.

864807
869325

Fax : 869326

864812

865141 — 50

චක්‍රලේඛ අංක 97/5(I)

මගේ අංකය
எனது இல.
My No. } 4/ගුරුඅ. I/3099(II)

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி அமைச்சு
Ministry of Education and Higher Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ.
බත්තරමුල්ල.
'இசுருபாய', ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே,
பத்தரமுல்லை.
'ISURUPAYA' SRI JAYAWARDHANAPURA KOTTE.
BATTARAMULLA

දිනය
திகதி
Date } 1997 මැයි මස 19 වැනි දින.

සියලුම ප්‍රධාන අමාත්‍ය ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.

## ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන
## උපාධි ගුරු වැටුප් - 1995

මගේ සමාංක හා 1997.04.30 දින දරණ චක්‍රලේඛයට අමතරවයි.

02. මෙම චක්‍රලේඛය සමග අමුණා තිබූ සංශෝධනයන්හි උපාධිධාරි ගුරුවරුන් අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳ උපදෙස් වරදවා තේරුම් ගෙන ඇති බව විටින් විට මෙම කාර්යාලයට ලැබෙන විමසීම්වලින් පෙනේ.

03. උපාධිධාරී ගුරුවරුන් අන්තර්ග්‍රහණය කිරීමේ දී ගෞරව උපාධිධාරීන්ට ද, අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට ද , පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා උපාධි ලබාගත් උපාධි ධාරීන්ට ද සේවයේ එක් වසරක් සඳහා හිමිවෙන්නේ ලකුණු 2 ක් පමණි.

04. අධ්‍යාපනවේදී උපාධිධාරි හෝ ගෞරව උපාධිධාරියකු නොවන තැනැත්තකු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලබා ගැනීමෙන් පසු සේවා කාලය සඳහා පමණක් එක් වසරකට ලකුණු 2 බැගින් හිමි වන බව ද සටහන් කරගත යුතුය. ගෞරව උපාධිධාරි ගුරුවරයකු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගැනීමේ හේතුවෙන් ඔහුට අමතර ලකුණු 2 බැගින් හිමි නොවේ. ඔහුට ද හිමි වන්නේ කලින් මෙන් සේවා කාලයේ එක් වසරක් සඳහා ලකුණු 2 ක් පමණි.

05. ගෞරව උපාධිධාරීන් යනු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්වචනය අනුව ගෞරව උපාධිධාරීන් වශයෙන් සැලකෙන තැනැත්තන් පමණි.

කරුණාකර මේ අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්න.

සේනානායක උපදේශ